# සහෝදරත්වයේ දෑත්

මෙල්බන් නුවර පවතින ශ්‍රී ලාංකික සමිති සමාගම් කිහිපයක මෙන්ම 3ZZZ සිංහල ගුවන් විදුලියේ වර්තමාන කමිටුවේ සාමාජිකයෙක් වූද, Pakenham හි පදිංචිවී, මෙතෙක් අනාවරණය කරගැනීමට නොහැකි වූ ස්නායු රෝගයක් හේතුවෙන් ආබාධිත වී නිසි පරිදි ඇවිදීමට ද නොහැකිව අසරණ වී සිටින ජානක කේ. බාලසූරිය සොයුරාට ඉදිරි වෛද්‍ය ප්‍රතිකාර සඳහා අරමුදලක් ඇතිකර දී ඔහුට ශක්තියක් වීමේ අරමුණින් 2015 දෙසැම්බර් මස 06 වැනි ඉරුදින Hampton Park – Arthur Wren Hall හිදී අප විසින් පවත්වන ලද ආහාර පොළ මානව දයාව සහ කාරුණික හදවත් ඇති බොහෝ පිරිසකගේ දායකත්වයෙන් සාර්ථක කරගැනීමට හැකි වූ අතර ජානක බාලසූරිය සොයුරාට ඩොලර් 14,000.00 ක මුදලක් පරිත්‍යාග කිරීමට අපට හැකි වූ බව සතුටින් ප්‍රකාශ කරමු.






2015 නොවැම්බර් මස 26 වැනි දින පටන් බොහෝ ගුවන් විදුලි නාලිකා මගින්ද, ඊමේල්, දුරකථ ඇමතුම් හා ෆේස්බුක් මගින් ද අප විසින් මේ පිළිබඳව ප්‍රජාව දැනුවත් කර ලද අතර ආහාර පොළ පැවැති දිනයේ, එනම් දෙසැම්බර් මස 06 වැනි ඉරුදින ,ඍය්බබැක 31, රූපවාහිණී නාලිකාව ඔස්සේ ද ප්‍රචාරක කටයුතු සිදුකරන ලදී.

මේ පිළිබඳව දැනගත් මොහොතේ පටන් පරිත්‍යාගශීලී බොහෝ පිරිසක් අප අමතා ආහාර පොළට අවශ්‍ය අමුද්‍රව්‍ය රැසක් මෙන්ම මුදල් ආධාරද ලබාදෙන ලදී. මෙල්බන්හි ශ්‍රී ලාංකික ව්‍යාපාරි ආයතන කිහිපයක සහයෝගයද අපවෙත ලැබුණි. ආහාර පොළට අවශ්‍ය වූ මුළුතැන්ගෙයි උපකරණ හා මෙවලම් බොහොමයක්ම ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ඕස්ට්‍රේලියානු ආදි ශිෂ්‍ය සංගමයෙන් අප වෙත ලැබුණි. එම භාණ්ඩ ශාලාව වෙතත් ආහාර පොළ නිමවූ පසු නැවත එම සංගමය වෙනත් නොමිළේ ප්‍රවාහනය කිරීමට මාගේ හිතවතෙකු ඉදිරිපත් විය.

ආහාර පොළට පෙර දින සවස්වරුවේ අප සංවිධායක කමිටුවේ අජිත් ප්‍රියන්ත පෙරේරා සොයුරා ඇතුලු හිතවතුන් කිහිපදෙනෙකු අප නිවසට පැමිණ හෝරා කිහිපයක් ගතකර ආහාර පොළ සඳහා පෙර සූදානම් කටයුතු නිමකළ හෙයින්ද, ඇතැම් ව්‍යංජන හිතවතියන් දෙදෙනෙක් එදින පෙරවරුවේ තම නිවස් වල පිසින ලද හෙයින්ද, රෝ හිත, ක්‍රිෂාන්ත ඇතුලු ජානක බාලසූරිය සොහොයුරාට හිතවත් කණ්ඩායමක් විසින් ඔවුන්ගේ වියදමින් හා ශ්‍රමයෙන් ආහාර වර්ග කිහිපයක් සකස් කර ආහාර පොළට ගනැවිත් භාරදුන් හෙයින්ද දවස පුරා ආහාර සකස් කිරීමේ කටයුතු වල නිරත වූ 12 දෙනෙකුගෙන් සමන්විත වූ අපගේ මුලුතැන්ගෙයි කණ්ඩායමට තිබූ අභියෝගය යම් පමණකින් ලිහිල් විය.

ආහාර සැකසීමේ කටයුතු මෙසේ සංවිධානය වන අතරතුරදී අප සංවිධායක කමිටුවේ ජූඩ් ප්‍රනාන්දු සොයුරාගේ උත්සාහයෙන් එදින ආහාර පොළට පැමිණෙන පිරිස පිනවීම සඳහා වේදිකාවේ කලා කටයුතු සියල්ල කිසිදු වියදමකින් තොරව අංග සම්පූර්ණ කරගැනීමට අපට හැකියාව ලැබුණි. මෙල්බන් නුවර සංචාරයක් සඳහා පැමිණ සිටින ප්‍රවීණ ශ්‍රී ලාංකික නිවේදක ශ්‍රී නිමල් පද්මකුමාර මහතා විසින් එදින නිවේදන කටයුතු සිදුකරන ලදී. මෙල්බන්වාසී වෘත්තීය මට්ටමේ සංගීත ශිල්පීන් රැසකගේ මෙන්ම මෙල්බන්හි ලාබාලතම ශ්‍රී ලාංකික සංගීත කණ්ඩායම වන "DYNAMICS" සංගීත කණ්ඩායමේ දායකත්වයද අපවෙත ලැබුණු අතර ශබ්ද වාහිනී හා ශබ්ද මිශ්‍රණ උපකරණ විජිත දේවගේ සොයුරා විසින් සපයන ලදී. ප්‍රවීණ හා ආධුනික ගායක ගායිකාවන් රැසක් දවස පුරා ගී ගයන අතරතුරදී නැටුම් ගුරුවරියක් හා දැරියන් දෙපිරිසක් විචිත්‍ර ඇඳුමින් සැරසී වරින් වර ඉදිරිපත් කරන ලද අලංකාර නර්තනයන් වේදිකාව වර්ණවත් කරමින් පැමිණ සිටි පිරිසට මහත් ආශ්වාදයක් ගෙනදෙන ලදී.

එදින ප.ව. 1.30 සිට ප.ව. 3.30 පමණ වනතුරු ජානක බාලසූරිය සායුරා සිය පවුල සමඟ පැමිණ ශාලාවේ අසුන් ගෙන සිටි අතර බොහෝ දෙනෙකු ඔහු සමීපයට ගොස් වචන කිහිපයක් හෝ ඔහුගේ මනසට යම් ශක්තියක් ලබාදීමට අමතක නොකළෝය. ජානක බාලසූරිය සොයුරාගේ අසනීප තත්ත්වය සහ ඔහු වෙනුවෙන් පවත්වනු ලබන ආහාර පොළ පිළිබඳව මාගේ හිතවතෙකුගෙන් දැනගත් මේ වනවිට මෙල්බන් නුවරට වැඩම කර සිටින ශාන්ති පදනමේ නිර්මාතෘ, කොළඹ බෞද්ධාලෝක මාවතේ පිහිටි සේරුවිල බෞද්ධ මධ්‍යස්ථානයේ ප්‍රධාන සංඝනායක අති පූජ්‍ය කොටපොල අමරකිත්ති ස්වාමීන් වහන්සේ හදිසියේ වැඩම කර ජානක ඉදිරියේ සිට සිදුකරන ලද පිරිත් දේශනය ඔහුට විශේෂ ආශිර්වාදයක් විය.

ආහාර පොළ පෙ.ව. 1.30 ට පමණ ආරම්භ කරන ලද අතර ප.ව. 08.30 ට පමණ අවසන් කරන ලදී. එදින සවස් වරුවේ ඉතිරිව තිබූ වියළි ආහාර බොහොමයක්ම අළෙවි කර ගැනීමට හැකිවූ අතර දිල්හානි පෙරේරා සොයුරිය විසින් පරිත්‍යාග කරන ලද අලංකාර කේක් සැරසිල්ල ඩොලර් දහසකට වෙන්දේසි කර ගැනීමටද හැකිවිය. ආහාර පොළට සහභාගී වීමට හැකියාවක් නොතිබූ හිතවතුන් කිහිප දෙනෙකු ආහාර පොළට පැමිණි ඇතැමුන් අත මුදල් ආධාර එවීමට තරම් කාරුණික වූ බවද පැවසිය යුතුය. එදින පැමිණ පිරිස ඩොලර් 10 සිට ඩොලර් 500 දක්වා තමුන්ට හැකි අයුරින් ආධාර කර තිබූ අතර නම හෙළිකිරීමට කමැති වූ අප හිතවතෙක් එදින සුළුවෙන් හෝ කරන ලද ආධාරයද අපට ඉතා වැදගත් විය. සංවිධාක කමිටුව, ශ්‍රී නිමල් පද්මකුමාර නිවේදක මහතා සහ අප හිතවතුන් කිහිප දෙනෙකු ඉදිරියේ ආධාර මුදල් ගණනය ප.ව. 9.00 ට පමණ අරඹන ලද අතර කේක් වෙන්දේසියෙන් ලැබුණු මුදල වියළි ආහාර අළෙවියෙන් ලැබුණු මුදල සහ එදින ලැබුණු ආධාර මුදල් වල එකතුව ඩොලර් 15,018.00 ක් වූ බව සතුටින් ප්‍රකාශ කර සිටිමු.

මම පුන්‍යකර්මය මෙසේ සාර්ථක කරගැනීම සඳහා ප්‍රචාරක කටයුතු වලින් සහය වූ 3zzz, Ranjith & Ruby SBS යන ගුවන් විදුලි නාලිකා වලටත් Channel 31 රූපවාහිනී නාලිකාවටත්, මේ පිළිබඳව දැනගත් මොහොතේ පටන් අප වෙත අමතා ආහාර පොළ කටයුතු සඳහා මුදලින් හා ආහාර ද්‍රව්‍ය වලින් ආධාර කළ සැමටත්, MKS Spices, N'things, Lion Bake House, A & Jay Car Rentals yd EMS Exchange යන ව්‍යාපාරික ආයතන වලටත්, මුළුතැන්ගෙයි උපකරණ හා මෙවලම් ලබාදුන් ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනනීය ඕස්ට්‍රේලියානු ආදි ශිෂ්‍ය සංගමයටත්, මේ වෙනුවෙන් තම කාලයෙන්, ශ්‍රමයෙන් හා ධනයෙන් නොයෙකුත් අයුරින් සහයෝගය ලබාදුන් අප හිතවතුන් සියලු දෙනාටත්, එදින ආහාර පොළට පැමිණ හෝ නොපැමිණ ආධාර කළ සැමටත් සංවිධායක මණ්ඩලයේ හෘදයාංගම ස්තූතිය පුදකරනු ලබන අතර එදින හදිසියේ සිය කැමැත්තෙන්ම වැඩමකර විශේෂ පිරිත් දේශනයකින් ජානක සොයුරාට ආශිර්වාද කළ අති පූජ්‍ය කොටපොල අමරකිත්ති ස්වාමීන්වහන්සේට සිරස නමා අපගේ ගෞරවණීය ප්‍රණාමය පුදකර සිටිමු.

**ශ්‍යාම් පී. ජයතුංග**
සංවිධායක කමිටුව වෙනුවෙන්

## Christmas Carol Service at the Monash medical centre,Clayton,
**Presented by ( Aus Audio Visual Association )**

Coordinator Mr Wajira Ekanayake, Photography by U.D.Perera




